# උපදෙස් පත්‍රිකාව

**ලොතරැයිපත් අලෙවිකරණ අඩු ආදායම්ලාභි පුද්ගලයින්ගේ පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මඟින් අධ්‍යාපන ආධාර ලබාදීම**

## සුදුසුකම්

- ලොතරැයිපත් අලෙවිකරනු ලබන අඩු ආදායම්ලාභි පවුලක පාසල් අධ්‍යාපනය ලබන දරුවෙක්/දරුවන් විය යුතුය
- දැනට ජනාධිපති අරමුදලේ වෙනත් වැඩසටහනක් මඟින් අධ්‍යාපන ප්‍රතිලාභ නොලබන දරුවෙකු/දරුවන් විය යුතුය.
- රජයේ පාසලක හෝ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසලක ඉගෙනුම ලබන දරුවෙකු/ දරුවන් විය යුතුය.

## අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සහ භාර දීම.

- අයදුම්පත්‍රයේ I කොටස ලොතරැයිපත් අලෙවිකරන පුද්ගලයා විසින් සම්පූර්ණ කළ යුතුය.
- සෑම විටම නිවැරදිම තොරතුරු ඇතුළත් කළ යුතුය.
- කෙටි පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කරන්න.
- අයදුම්පතෙහි 1.5 යටතේ අලෙවි කරනු ලබන ලොතරැයිපත් වර්ගය ඉදිරියේ "√" සලකුණ යෙදිය යුතු අතර, DLB සහ NLB ලොතරැයිපත් දෙවර්ගයම අලෙවිකරනු ලබනුයේ නම් දෙකම යන ස්ථානයේ "√" දැමිය යුතුය.
- අයදුම්පතෙහි 1.6හි පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ගේ තොරතුරු ඇතුළත් කළ යුතු අතර, 1.7හි පවුලේ අනෙක් සමාජිකයින්ගේ තොරතුරු ඇතුළත් කළ යුතුය.
- අයදුම්පතෙහි 03හි අයදුම්කරු ලොතරැයි අලෙවිකරන ලබන අලෙවි නියෝජිතගේ නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතු අතර, එම අයදුම්පතෙහිම 04 යටතේ අලෙවි නියෝතගෙන් ඒ බව සනාථ කිරීම් ලබාගත යුතුය.
- අධ්‍යාපනය ලබන දරුවා/දරුවන් එකම පාසලේ අධ්‍යාපනය ලබන්නේ නම්, අදාළ පාසලේ විදුහල්පති මඟින් පාසල් අධ්‍යාපනය ලබන බවට වන සහතිකය අයදුම්පතෙහි අංක 05 මඟින් ලබාගත යුතුය.

  සැ.යු. :- දරුවන් කිහිපදෙනෙකු සිටින පවුලක, එම දරුවන් එකම පාසලකට නොයන්නේ නම්, එක් එක් පාසලේ විදුහල්පති මඟින් නිර්දේශ ලබා ගැනීම කළ යුතු අතර, පසුව අදාළ නිර්දේශ අයදුම්පත්‍රය සමඟ අමුණා භාර දිය යුතුය.
- පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳ සහතිකය, තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මඟින් අයදුම්පතෙහි අංක 06 මඟින් ලබාගත යුතුය.

- **<u>මෙම අයදුම්පත ඔබ පදිංචි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරදිය යුතු අතර,</u> (අයදුම්පත් ජනාධිපති කාර්යාලයට හෝ ජනාධිපති අරමුදල වෙත ගෙනවිත් භාර දීම හෝ තැපැල මඟින් යොමු නොකළ යුතුය.)**

## අයදුම්පත්‍රය සමඟ භාරදිය යුතු ලේඛන

I. දරුවාගේ/දරුවන්ගේ මව/පියා/භාරකරුගේ, ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත.
II. දරුවන් සහ ලොතරැයිපත් අලෙවිකරුගේ අනන්‍යතාවය තහවුරු වන ලේඛන. (දරුවා/දරුවන්ගේ උප්පැන්න සහතිකවල සහතික කරන ලද පිටපත්)

**ඔබට තවදුරටත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම් පහත දුරකථන අංකය වෙත ඇමතුමක් ලබා දීම සිදු කළ හැකි ය.**

**011 -4 354 250 - දිගු අංකය :- 1271**